

# වෙල්ගම්පොල සඳරන් ගී

චන්දිමා

**Samanthi Fernando**

WELGAMPOLA MOONGOLD STANZAS

1. මුදු මල්
2. දුහුල් වළා
3. උණුසුම් ආරාධනා
4. සමනල යුගයක ප්‍රාර්ථනා
5. එදා-මෙදා-සදා මගේ අම්මා
6. රන්මහසෑය
7. පැතුම් මල්
8. ගුරු මව
9. ඉදිරියටම යමු
10. රුවන් චේතනා
11. ප්‍රිය සෙනේ මිහිර
12. කවියෙන්
13. ආගමනයේ යාතිකාව
14. පුර හඳ
15. සමුගැනීම්
16. මවක මිහිර
17. ගිම්හානයේ හිම
18. සඳු දුව නැලවෙයි
19. දෙවිඳුන්ගේ ආරාධනාව
20. සාගර තරුව
21. ශාන්ත ගීතිකා
22. සැනසිල්ලේ නැලවිල්ල
23. මල් පහන්
24. පෙම් හසුන
25. නිලඹර

## 1 ✿ මුදු මල්

මුදු මල් පොකුරක්
ඔබ වෙත පුදමි
ආසිරි ආසිරි වේවා

මුදු මල් පොකුරින්
මල් පෙති සලමි
ආසිරි ආසිරි වේවා

මුදු මල් අතරින්
ලන්දට දුවමි
අක්කා සමඟින්
සෙල්ලම් කරමි

මුදු මල් පොකුරින්
මල් පෙති සලමි
බමරුන් වාගේ
ආසිරි ඇවිදින්

පොකුරක මල් අපි
අක්කා සමඟින්
මව් පිය දෙදෙනා
නමදිමි සැමදා

## 2 ✿ දුහුල් වළා

යොවුන් සිනා මැද
රන් කිරුළු පළඳා
එදා අහසේ මැවූ
අපේ ලොවේ සටහන්
දුහුල් වළා අතරේ
සැඟවී ගියාදෝ

## 3 ✿ උණුසුම් ආරාධනා

අඳුරු උයනේ පහන් එකිනෙක දල්වා
හිතවත් හදවත් හසරැලි ඡායා
සෙවනැලි අතරින් සැරසිලි නංවා
නව යුගයකට උණුසුම් ආරාධනා

## 4 ✿ <u>සමනල යුගයක ප්‍රාර්ථනා</u> 🎶

සොයමින් සහන් එළියක් මා
සිටියත් මේ රන් දෙරණේ
ලබනට නිවන් මොහොතක්
මේ නොනිදනා ලෝකේ

අසන්නට ලැබුනා මධුර ගායනා
පුබුදමින් මිහිරි මතකයන්
සමනල යුගයක ප්‍රාර්ථනා

ඒ ස්වර මාලා අතරින් රිංගා
සටහන් වූවා සිත් අරණේ
නොමැකෙනසේ නොමැකෙනසේ

දෙසවන් වැටුනා මධුර ගායනා
නිවන් මොහොතක් සිතේ පුබුදාලා
සහන් සුවේ යළි කැඳවා

භව සරණා මා සොයමින් සිටි ඒ
සහනය මාසිත තුලම පහන් වූවා
නොමැකෙනසේ නොමැකෙනසේ

සහන් සුවේ යළි පතුරා
ගලනා සේ හද උතුරා
නොමැකෙනසේ නොමැකෙනසේ

## 5 ✿ එදා - මෙදා - සදා මගේ අම්මා

එදා උණුසුම් දෝතින් වඩා
හැඩූ කඳුලුත් පිසදා
සිත සන්සුන් කළ අම්මා

මෙදා බැතියෙන් සෙත සලසා
දයාවෙන් ගැටලුත් විසඳා
සිතට සැනසුම් දෙන අම්මා

සදා දෙව්සුව පිහිට පතා
දරු සෙනෙහසත් ලබා
සිතින් නිදුක්වී සිටින් අම්මා

## 6 ✿ රන්මහසෑය

රන්මහසෑය බලා එමු අපි දවසක
රජරට පෙම්රස මුසු වන්දනාවක
කල්යනමුදු ඒමතුසඳ එළිවන්න
කලයාණ මිතුදම් ඇති ඉවසන්න

## 7 ✿ පැතුම් මල්

මිතුරු සුවය රැඳෙන
ඔබේ ලොවට - තරු රැසක් වී
නෙත් මඬලේ යලි දිලෙන්නම්
බාලේ සුවඳ රැගෙන
ඉදිරි මගට - මල් වැලක් වී
සිත් උයනේ යලි පිපෙන්නම්

## 8 ✿ ගුරු මව

ඈත දේශවල කථා මැවූ
දෛවයට පෙර හුරු ගැන්වූ
දහමින් මුල් පිටු රසවත් කළ
දැනුමෙන් මගේ ලොව එළිය කළ
ජීවන ගසේ ආදර මුදුන් මුල
තෙරුවන් සරණයි ඔබට, ගුරු මව

## 9 ✿ ඉදිරියටම යමු

අනන්තවූ මෙත් දහරා මැද
ඇයි පින්වතුනේ දුක්වන්නේ
කිඳෙන හදට පිහිටක් වී
උතුම් හදින් සුව පැතිරෙන්නේ

ඉදිරියටම යමු - ඉදිරියටම යමු
ජේසු තුමා අප පිළිගන්නේ
නිසැක සිතින් - තුති දෙමින් යමු
ජේසු තුමා අප පිළිගන්නේ

අනන්තවූ සෙත් දහරා දැක
ඇයි පින්වතුනේ නවතින්නේ
බිඳුන හදට අරුතක් දී
රිදුම් වලින් අප ගලවන්නේ

ඉදිරියටම යමු - ඉදිරියටම යමු
ජේසු තුමා අප පිළිගන්නේ
නිසැක සිතින් - තුති දෙමින් යමු
ජේසු තුමා අප පිළිගන්නේ

## 10 ✿ <u>රුවන් චේතනා</u> 🎶

සුරංගනා ලොවෙන් එදා
දුහුල් මල් නෙලා
ප්‍රියංකරයි සිතේ මැවූ
රුවන් චේතනා

කල්පනා උයන් තෙරේ
සිනා පොදක් සොයා
ඔබේ නමින් මලක් පුදා
කල්පයක් ගෙවා

සුරංගනාවියන් ගෙනා
රෝස මල් පෙති
ප්‍රියංකරයි හදින් හදේ
රුවන් චේතනා

රන් තරංගයක් වගේ
පහන් සිතින් නැගී
ඔබේ හඬින් අදත් මගේ
වේදනා නිවා

සුරංගනා ලොවෙන් එහා
ප්‍රදීපයේ පිපී
ප්‍රියංකරයි සදා අපේ
රුවන් චේතනා

## 11 ✿ **ප්‍රිය සෙනේ මිහිර**

මල් වැස්සේ මැයි මාසේ
දේදුන්නක් නැතිවට
පෙම් සුවඳක් දැනුනා
ඒ මුදු මුල් දිනේ

මල් වැල් පිපී සොඳුරු
අත් වැල් වෙලී
දුන් ප්‍රිය සෙනේ
කොයිදෝ ගියේ
මිහිර කොයිදෝ ගියේ

මල් අතු වළා අතර
දෙලොවේ රසේ
ඒ සුවඳ ඇත මිහිර
පෙම් සුවය රැඳුනා හදේ

## 12 ✿ **කවියෙන්**

සොඳුර ඔබේ නෙත් මඬලේ
පියකරු දසුනක් මවන්න
නිමල සිහිනයක් දැවටුන
කවි ලියුවෙමි ආදරයට

සොඳුර ඔබේ ලය අභියස
සුසුමක්වී නැලවෙන්නට
දැවෙන මතකයන් පිළිබඳ
කවි ලියුවෙමි ආදරයට

සොඳුර ඔබේ සිනහ මුවින්
කතා අසා සතුටින් මම
කවදාහරි කියවන්නට
කවි ලියුවෙමි ආදරයට

සොඳුර ඔබේ පියවර නැති
නිහඬ මාවතේ තනිවම
වැලපෙන සිත සනසවන්න
කවි ලියුවෙමි ආදරයට

සොඳුර අපේ පෙම් කතාව
සටහන්කර අතහරින්න
කවදාහරි ඔබ අසන්න
කවියෙන් කීවෙමි සදහට

## 13 ✿ ආගමනයේ යාතිකාව

ජේසු බිළිඳා
දේව දරුවා
සාමයේ නාමයෙන්
වඩිනු සමිඳුනේ

ජේසු බිළිඳා
කිරුළ පළඳා
දයාවේ ප්‍රභාවෙන්
වඩිනු සමිඳුනේ

## 14 ✿ පුර හඳ

රහස් කියන ඇස් දෙකනම් බොරු කීවේ නෑ
අහස් තලේ තරු ගැන දෙඩුවේ සිහිලැල් රෑ
සුරතල් අදහස් රන් සඳ කිරණක හංගා
සුසුම් හෙලා තනි තරුසේ දෙඅතට හැරුනා
එක ඉර යට එක දෙව් පිහිටෙන්දෝ මන්දා
ඉරණමසේ පුර හඳ යළි මැව්ලා පෙනුනා

## 15 ✿ **සමුගැනීම්**

ඈතින් හමා එන
වියෝ ගීයක
මතක සුසුමන්
මුසුවන්නේ

වැඩිහිටි සෙවණේ
බැබලුන තරුවැල්
එකිනෙක සැඟවී
සමුගන්නේ

ඉදිරි ගමනට
දිරිය දෙනු මැන
සදා සරණේ
පියාණනේ

## 16 ✿ <u>මවක මිහිර</u> 🎶

ගිණි නැගී දවා හදේ
අඳුරැ විල මැදින්
සිත පුරා සෙනෙහසින්
ඇය සොයා ගොසින්

මවක මිහිර මට දැනේ - මලක සුවඳ සේ
මවක මිහිර මට දැනේ - පුරුදු සුවය සේ

වදන් මැකී මගේ පොතේ
ලොව දුරස් වෙමින්
සවන් යොමා බැති සිතින්
ඇය සොයා ගොසින්

මවක මිහිර මට දැනේ - මලක සුවඳ සේ
මවක මිහිර මට දැනේ - පුරුදු සුවය සේ

රණ් පහන් දිළී සිතේ
දිරිය සවි වෙමින්
අපේ යැදුම් අපේ ගැයුම්
ඇය සොයා ගොසින්

මවක මිහිර මට දැනේ - මලක සුවඳ සේ
මවක මිහිර මට දැනේ - පුරුදු සුවය සේ

ගිණි නිවී මගේ හදේ
දෙව් වදන් තුලින්
අපේ පැතුම් ගලා මැවේ
ඇය සොයා ගොසින්

මවක මිහිර මට දැනේ - මලක සුවඳ සේ
මවක මිහිර මට දැනේ - පුරුදු සුවය සේ

## 17 ✿ **ගිම්හානයේ හිම**

සුදු මල් ගොමුවක තනි වෙලා
සුර කුමරියකට පද ලියා
රන් සමනල තටු කැඳවලා
සෙනෙහස ගැයුවේ හඬ නගා

තනි නැත සුනිමල දෙස බලා
සෙවනැලි වැටුනේ සැනසිලා
නිල්වන් අහසට ඇස් යොමා
දුටුවේ ඈ හා ජේසු තුමා

## 18 ✿ සඳු දුව නැලවෙයි

නිතර ඔබේ සුවඳ මගේ ලොවට ඇදී එන්නේ
වලා තුලින් හිරු පෑවා සේ හසරැලි මතු වන්නේ

තරු සඳ නලවයි - තරුවක් පිබිදෙයි
සඳු දුව නැලවෙයි - සුරලෝ සොයමින්නේ

අතරතුරේ දුක් වරුසා සුලිසුලන් හමා ආවත්
අවදි සිතින් සිහින මවා දුර කතරම ජය ගන්නේ

තරු සඳ නලවයි - තරුවක් පිබිදෙයි
සඳු දුව නැලවෙයි - සුරලෝ සොයමින්නේ

මතක පොතේ රැඳි ලස්සන ගී පද යළි තුරුලට කැඳවන්නේ
ඔබේ හඬින් නැලවෙන්නට යළි දෙව් වරම් ලබා ගන්නේ

තරු සඳ නලවයි - තරුවක් පිබිදෙයි
සඳු දුව නැලවෙයි - සුරලෝ සොයමින්නේ

## 19 ✿ දෙවිඳුන්ගේ ආරාධනාව

ඔබේ ශ්‍රී ගුණ – ලොවට කියන්නට
මා කැඳවූ දෙවිඳේ
ඔබේ සුවබර ආරාධනාවට
මාගේ ආත්මය - පුද කරමි දෙවිඳේ

ඔබේ ශ්‍රී හද – නමදින්නට
මා කැඳවූ දෙවිඳේ
ඔබේ දයාබර ආරාධනාවට
මාගේ උරුමය - පුද කරමි දෙවිඳේ

ඔබේ ශ්‍රී නම – පසසන්නට
මා කැඳවූ දෙවිඳේ
ඔබේ පින්බර ආරාධනාවට
මාගේ ගී පද – පුද කරමි දෙවිඳේ

## 20 ✿ සාගර තරුව

සදා සරණ මව් පදවිය
අනුකම්පා බලවේගය
බිය නැති - සැක නැති
ඇය කවුදෝ
එතුමිය ගැන නම්
පද රචනය මනරම්

මල් ලෝකේ සුනිමාලිය
කුසුමකි ඇය සුසුම් දරණ
සාගරයේ තරුවක් ලෙස
ලියවී ඇත - නැවත ලියමි
රුවල් බඳින ලය රකින්න

## 21 ✿ ශාන්ත ගීතිකා

ශාන්තවූ ඔබේ හඬින්
ගීතිකාවක්දෝ ඇසෙන්නේ
නිසලවූ මගේ සිතේ
සිහිනයක්දෝ මැවෙන්නේ

## 22 ✿ සැනසිල්ලේ නැලවිල්ල

සුර ලියන් සැරිසරන උයනක
අඹ ගසක් යට රහස් කිය කිය
කුමරියන් ලෙස ගෙවූ ළමාවිය
රස කථාවකි සිත සැනසිල්ලට

පිනි බිඳු දිලිසෙන මුතු කැට
උඳුපියලිය මත රජ සැප
නිලඹර සරසන රන් හඬ
ගෙදර රඟහල අපේ උරුමය

## 23 ✿ මල් පහන්

මල් පහන් පුදා
මෙත් සිතින් පතා
රන් රැසින් දිලී වඩින්න
දේව දූතිකා

## 24 ✿ **පෙම් හසුන**

උදා හිරු දිය රැලි සිප ගන්නේ
රෑ වන තුරු නේද෼ෝ
ඒ ඉර යළි පායන බව කීවේ
බබලන තරු නේද෼ෝ
එන භවයට පෙම් හසුනක් දුන්නේ
උණුසුම දැන නේද෼ෝ
උමතු ලෙසින් ඒ ඉරණම පැතුවේ
මේ භවයට නේද෼ෝ

## 25 ✿ **නිලඹර**

නිලඹර මට ගෙන දුන්න
නිවහල් ඔබේ සිතුවිල්ල
පද වැලකට අරුතක් ලෙස
අද පමණක් නොව එහි රස



# Thank you for reading

*you can find my English Poetry Books at*

amazon.com/author/samanthifernando

*my father's Sinhala songs*

🎶 ***youtube.com/@stanwelmusic***

*my playlist 🎶 youtube.com/@starsafirepoems*

**STARSAFIRE POEMS**
starrayz.com
*California, United States*

@poetsamanthifernando